රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 06/2014

මගේ අංකය: EST/8/ALLOW/03/121
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2014.03.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ව්‍යාප්ති කටයුතුවල නිරත ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දීමනා</u>**

රජය විසින් ප්‍රකාශිත 2014 අයවැය යෝජනා අනුව බිම් මට්ටමේ ව්‍යාප්ති සේවා ශක්තිමත් කිරීම සඳහා කෘෂි ව්‍යාප්ති, පශු වෛද්‍ය, වාරිමාර්ග හා වනජීවී වැනි කටයුතුවල නිරත ක්ෂේත්‍ර නිලධාරීන් දිරිමත් කිරීම වෙනුවෙන් 2014 ජනවාරි මස සිට මාසික දීමනාවක් ගෙවිය යුතුය.

02. ඒ අනුව ඔබ අමාත්‍යාංශය/ පළාත් සභාව යටතේ ඇති රාජ්‍ය ආයතනවල, ව්‍යාප්ති කටයුතුවල නිරත, මෙම චක්‍රලේඛයේ ඇමුණුම I හා ඇමුණුම IIහි සඳහන් නිලධාරීන්ට 2014 ජනවාරි මස සිට මාසිකව රු.300/-ක දීමනාවක් ගෙවීම අනුමත කරමි.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව නිකුත් කරන ලදී.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම 01

මධ්‍යම රජයේ සේවක සංඛ්‍යා තනතුරු - ක්ෂේත්‍ර නිලධාරි

| අනු අංකය | තනතුර |
|---|---|
| 1 | ගොවිජන සංවර්ධන නිලධාරි |
| 2 | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර |
| 3 | සහකාර හිමිකම් විමර්ශන නිලධාරි |
| 4 | බීට්ටු වන නිලධාරි |
| 5 | වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරි |
| 6 | ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර |
| 7 | ප්‍රජා විශෝධන නිලධාරි |
| 8 | ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරි |
| 9 | සමුපකාර සංවර්ධන නිලධාරි |
| 10 | සංවර්ධන සහකාර* |
| 11 | සංවර්ධන නිලධාරි* |
| 12 | පරිසර කළමනාකරණ නිලධාරි |
| 13 | ව්‍යාප්ති නිලධාරි |
| 14 | ක්ෂේත්‍ර නිලධාරි (කම්කරු දෙපාර්තමේන්තුව) |
| 15 | ආහාර හා ඖෂධ පරීක්ෂක |
| 16 | වන ව්‍යාප්ති නිලධාරි |
| 17 | වන පාලක/සහකාර දිසා වන නිලධාරි |
| 18 | උද්‍යාන සංවර්ධන සහකාර |
| 19 | ග්‍රාම නිලධාරි |
| 20 | මානව සම්පත් සංවර්ධන සහකාර |
| 21 | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පරීක්ෂක |
| 22 | මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක |
| 23 | කම්කරු නිලධාරි |
| 24 | ඉඩම් පරිහරණ සැලසුම් සහකාර |
| 25 | පශු සම්පත් සංවර්ධන නිලධාරි |
| 26 | ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක |
| 27 | ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර |
| 28 | මුල් ළමාවිය සංවර්ධන සහකාර |
| 29 | ව්‍යාපෘති සංවර්ධන සහකාර |
| 30 | ව්‍යාපෘති නිලධාරි (ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව) |
| 31 | අඩවි වන නිලධාරි |
| 32 | සහන සොයුරිය |
| 33 | පර්යේෂණ හා සංවර්ධන නිලධාරි |
| 34 | රබර් සංවර්ධන නිලධාරි |
| 35 | නිපුණතා සංවර්ධන සහකාර |
| 36 | සංඛ්‍යාලේඛන නිලධාරි |
| 37 | කාර්මික නිලධාරි |
| 38 | කාර්මික සහකාර |
| 39 | වාප්පු ක්ෂේත්‍ර නිලධාරි |
| 40 | වනිතා සංවර්ධන නිලධාරි |
| 41 | වැඩ පරීක්ෂක (ප්‍රජා පාදක විශෝධක දෙපාර්තමේන්තුව) |

*	පහත නිර්වචනයට අයත්වන නිලධාරින් පමණක් මෙම දීමනාව සඳහා හිමිකම් ලබයි.

"ක්ෂේත්‍ර නිලධාරියා" යන්නෙන් ප්‍රධාන වශයෙන්ම බිම් මට්ටමේ ව්‍යාප්ති සේවා කටයුතු පැවරී ඇති, එක් විශේෂ ස්ථානයකට සීමා නොවන, ක්ෂේත්‍රයට නිතිපතා යා යුතු, පරීක්ෂණ හා චාරිකා සිදු කිරීම අවශ්‍ය වන්නා වූ, රාජකාරී ස්වභාවය අනුවම ක්ෂේත්‍ර රාජකාරිවලට සම්බන්ධ වන හා තම වගකීම් එක් නිශ්චිත සේවා ස්ථානයකට හෝ කාර්යාලයකට සීමා නොවන නිලධාරියෙක් අදහස් කෙරේ.

ඇමුණුම 02

පළාත් සභා සේවක සංඛ්‍යා තනතුරු - ක්ෂේත්‍ර නිලධාරි

| අනු අංකය | තනතුර |
|---|---|
| 1 | කෘෂිකර්ම උපදේශක |
| 2 | ජලජීවී වන සංවර්ධන නිලධාරි |
| 3 | ජනපද නිලධාරි |
| 4 | ප්‍රජා සංවර්ධන නිලධාරි |
| 5 | ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය සහකාර |
| 6 | සමූපකාර සංවර්ධන නිලධාරි |
| 7 | සංස්කෘතික නිලධාරි |
| 8 | සංවර්ධන නිලධාරි * |
| 9 | ක්ෂේත්‍ර උපදේශක |
| 10 | ආහාර හා ඖෂධ පරිපාලක |
| 11 | සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි |
| 12 | සත්ව සංවර්ධන උපදේශක |
| 13 | පලාත් පාලන සහකාර |
| 14 | පරිවාස නිලධාරි |
| 15 | මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරි |
| 16 | මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| 17 | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි |
| 18 | ග්‍රාම සංවර්ධන නිලධාරි |
| 19 | ජ්‍යෙෂ්ඨ ජනපද නිලධාරි |
| 20 | ජ්‍යෙෂ්ඨ සත්ව  සංවර්ධන උපදේශක |
| 21 | ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි |
| 22 | ජ්‍යෙෂ්ඨ සමාජ සේවා නිලධාරි |
| 23 | ජ්‍යෙෂ්ඨ ක්‍රීඩා නිලධාරි |
| 24 | සමාජ සේවා නිලධාරි |
| 25 | ක්‍රීඩා නිලධාරි |
| 26 | පලාත් ක්‍රීඩා නිලධාරි |

* පහත නිර්වචනයට අයත්වන නිලධාරින් පමණක් මෙම දීමනාව සඳහා හිමිකම් ලබයි.

''ක්ෂේත්‍ර නිලධාරීයා'' යන්නෙන් ප්‍රධාන වශයෙන්ම බිම් මට්ටමේ ව්‍යාප්ති සේවා කටයුතු පැවරී ඇති, එක් විශේෂ ස්ථානයකට සීමා නොවන, ක්ෂේත්‍රයට නිතිපතා යා යුතු, පරීක්ෂණ හා චාරිකා සිදු කිරීම අවශ්‍ය වන්නා වූ, රාජකාරී ස්වභාවය අනුවම ක්ෂේත්‍ර රාජකාරිවලට සම්බන්ධ වන හා තම වගකීම් එක් නිශ්චිත සේවා ස්ථානයකට හෝ කාර්යාලයකට සීමා නොවන නිලධාරියෙක් අදහස් කෙරේ.